**කහවත්ත ප්‍රාදේශීය සභාව**

**රත්නපුර දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 පෙබරවාරි 20 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 පෙබරවාරි 29 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 අගෝස්තු 29 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

### 1.2 මතය.

මගේ පරික්ෂණයෙන් පෙනි යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරිම් අනුව , කහවත්ත ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට කහවත්ත ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිලිබඳ තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මු දල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මුලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.

ගිණුම් විෂයයන් හතරකට අදාලව ලෙජර් ගිණුම් අනුව ශේෂයන්ගේ සහ උපයෝගී ලේඛන අනුව එම ශේෂයන්ගේ රු 3,425,391 ක් වූ වෙනසට හේතු සොයා බලා ලෙජර් ගිණුම් ගැලපීමට කටයුතු කර නොතිබුණි.

### 1.3.2. විගණනය සඳහා සාක්ෂි නොවීම.

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු 48,760,070 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු 4,545,796 ක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු 6,157,354 ක් විය.

### 2.2. ආදායම් පරිපාලනය .

### 2.2.1. ඇස්තමේන්තුගත ආදායම්,තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්.

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තු ගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තු ගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. 000 ' | රු. 000 ' | රු. 000 ' |
| (i) | වරිපනම් හා බදු | 2,777 | 3, 137 | 2,760 |
| (ii) | බදු කුලි | 2,931 | 2,917 | 731 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 727 | 702 | - |
| (iv) | වෙනත් ආදායම් | - | 8,440 | - |

### 2.2.2. වරිපනම් බදු

වරිපනම් බදු ඒකක 1326 කින් අය විය යුතු ශේෂය රු 2,537,889 වූ අතර එම ප්‍රමාණය තුළ හිඟ ශේෂය රු 5,000 ඉක්මවන ඒකක 111 කින් අයවිය යුතු ශේෂය රු 1,479,798 ක් විය. මෙම ඒකක 111ක ප්‍රමාණයේ හිඟ කාලය කාර්තු 1 සිට වසර 15 දක්වා කාල පරිච්ඡේදයක් විය.

### 2.2.3. බලපත්‍ර ගාස්තු

සභාව විසින් මස් මාළු කඩ සහ සති පොළ බදු දීම වෙනුවෙන් 2012 වර්ෂයට පෙර සිට පැවත එන රු 474,316 ක ශේෂයක් පැවති අතර එය අයකර ගැනීමට මෙතෙක් පියවර ගෙන නොතිබුණි.

### 2.2.4. උසාවි දඩ හා මුද්දර ගාස්තු

පලාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| (i) උසාවි දඩ | 1,513,166 |
| (ii) මුද්දර ගාස්තු | 5,339,510 |

### 2.3 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

කහවත්ත සතිපොළෙහි 2008 වර්ෂයට අදාලව අය කර ගැනීමට නොහැකිවූ රු 74,615 ක් කඩ කාමර කුලී මුදල ලේඛන වලින් ඉවත් කිරිමට රු 2012 ඔක්තෝබර් 30 දින මහා සභා රැස්වීම විසින් යෝජනා සම්මත කර තිබුණි. මේ සඳහා අමාත්‍යවරයාගේ අනුමැතිය ලැබීමට ප්‍රථම මෙම ශේෂය ලේඛන වලින් කපා හැර තිබුණි.

## 2.4 අවිධිමත් ගනුදෙනු

(අ) ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව ප්‍රධාන කාර්යාලය සඳහා කාර්යාල උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් 2012 මාර්තු 30 දින රු 222,365 ක මුදලක් පෞද්ගලික ආයතනයක් වෙත ගෙවා තිබුණි.

(ආ) 2012 ජනවාරි 10 දින පවත්වන ලද සුහද ක්‍රිකට් තරගාවලියක් වෙනුවෙන් රු 33,430 ක වියදමක් දරා තිබුණ ද 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 ( ඕ ) වගන්තිය ප්‍රකාරව අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබාගෙන නොතිබුණි.

## 2.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) 2010 සහ 2011 වසර වලට අදාලව වෙන් කරන ලද එකතුව රු 1,361,093 ක අගයක් වූ ණය හිමි ශේෂ 11 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් කිරිමට කටයුතු කර නොතිබුණි.

(ආ) තැන්පත් ලෙස 2012 දෙසැම්බර් 31 දිනට ගිණුම්වල දක්වා තිබූ රු 1,741,782 ක් වූ ශේෂය 2006 වර්ෂයේ සිට පැවත එන නමුත් මෙය හඳුනාගැනිමට උප ලේඛනයන් හෝ වෙනත් කිසිදු සාක්ෂියක් සභාව සතුව නොතිබුණි.

(ඇ) කොළඹ,ඇඹිලිපිටිය ප්‍රධාන මාර්ගයේ මාදම්පේ මංසන්ධිය දෙපස වර්ෂ ගණනාවක සිට දිනපතා සිදු කරනු ලබන මාළු තොග වෙළඳ පොළ සම්බන්ධව විධිමත් පාලනයක් හෝ බලපත්‍ර ලබා දිමක් සිදු කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී රු 13,821,400 අගයකට වු කර්මාන්ත 42 ක් ඇස්තමේන්තු කර තිබුන ද රු 1,975,000 ක්වූ කර්මාන්ත 6 පමණක් ඉටුකර තිබුණි.

**3. පද්ධති හා පාලන**

**-------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය

(ඉ) ණය හිමි පාලනය